# 21. පින්

සලීම් : අස්සලාමු අලෛයිකුම් තාබිත්.

තාබිත් : වඅලෛයිකුමුස්සලාම් සලීම්.

සලීම් : ඊයේ මස්ජිදයේ පැවැති රැස්වීමට ඔබ ආවේ නැ නේ ද?

තාබිත් : ඒ ගැන මම දන්නේ නෑ. මොකක් ද රැස්වීම?

සලීම් : ඒක හරි වැදගත් රැස්වීමක්. ගංවතුරෙන් අනාථවූවන්ට උදවු කිරීම ගැන සොයා බැලීමටයි, එම රැස්වීම පැවැත්වූයේ.

තාබිත් : එයින් ප්‍රයෝජනයක් වුණා ද?

සලීම් : ඔව්, බොහෝ ප්‍රයෝජන තිබුණා. අනුන්ට උදවු කිරීමේ අවශ්‍යතාවත්, දන් දීමේ වැදගත්කමත් අපගේ කතීබ්තුමා තේරුම් කරලා දුන්නා.

තාබිත් : කතීබ්තුමා මොනවා ද කීවේ?

සලීම් : අනුන්ට කළ හැකි හැම උපකාරයක් ම පිනක් වෙනවා. මුදලින් සහ ද්‍රව්‍යවලින් පමණක් දන් දිය හැකි බව නොසිතිය යුතුයි. අපගේ ශරීරයෙන් සහ ක්‍රියාවෙන් පින් කළ හැකි බව කිව්වා.

තාබිත් : එය කොහොම ද කියලා පැහැදිලි ව කිව්වා ද?

සලීම් : ඔව්, ඒ ගැන පැහැදිලි ව කිව්වා. සෑම යහපත් ක්‍රියාවක් ම පිනක් වෙනවා. කෙනකුට එක් යහපත් දෙයක් කියා දීමත් පිනක් වෙනවා.

අන් අයට අයහපතක් වන පාරේ තිබෙන ගල් මුල් වැනි දේ ඉවත් කිරීම පවා පිනක් වෙනවා. අන්ධයන්ට මඟ පෙන්වීම ද පිනක් වෙනවා. කුසගින්නෙන් පෙළෙන අයට ආහාර දීම ද පිනක් වෙනවා.

දුක් විඳින අසරණයන්ට අප කරන උපකාරය ද පිනක් වෙනවා.

අන් අය සමඟ සිනා මුසු මුහුණින් කතා කිරීම ද පිනක් වෙනවා.

තාබිත් : මේවා කොච්චර හොඳ දේවල් ද? සිසුන් වන අපටත් බොහෝ පින් කළ හැකියි නේ ද?

සලීම් : ඔව්, තාබිත්, මීට පස්සෙ අපිත් පින් කරමු. අල්ලාහ්ගෙන් ආනිසංස ලබා ගනිමු.

## පැවරුම්

**1.** **පහත සඳහන් වාක්‍යවලින් හොඳ ක්‍රියාවලට පමණක් කොටුව තුළ හරි '✓' ලකුණ යොදන්න.**

| | | |
|---|---|---|
| 1. | හොඳ දේ කියා දීම | ☐ |
| 2. | පාරේ තිබෙන පලතුරු ලෙලි ඉවත් කිරීම | ☐ |
| 3. | පාරේ සෙල්ලම් කිරීම | ☐ |
| 4. | අන්ධයන්ට පාර පෙන්වීම | ☐ |
| 5. | බිහිරි අයට විහිළු කිරීම | ☐ |
| 6. | කුසගිනි අයට කෑම ලබා දීම | ☐ |
| 7. | දුක් විඳින අයට උදවු කිරීම | ☐ |
| 8. | හිඟන්නන් එළවා දැමීම | ☐ |
| 9. | පොත් ඉරා දැමීම | ☐ |
| 10. | අන් අය සමග සිනා මුසු මුහුණින් කතා කිරීම | ☐ |